කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨය

වාණිජ විද්‍යාවේදී (විශේෂ) උපාධි සිව්වන වසර පරීක්ෂණය (බාහිර )-2011

2013 අගෝස්තු /සැප්තැම්බර්

**BCOME 4554 - කාර්මික නීතිය**

ප්‍රශ්න සංඛ්‍යාව : 07 කාලය : පැය 03 යි

ඕනෑම ප්‍රශ්න පහකට (05) පිළිතුරු සපයන්න.

---

01. " වැඩ ඉටු කිරීමේ ආකාරය පාලනය කිරීම, යම් ගිවිසුමක් සේවා ගිවිසුමක්ද නැතහොත් සේවය සැපයීම සඳහා වූ ගිවිසුමක්ද යන්න තීරණය කිරීමට ඇති එකම මිණුම් දණ්ඩ නොවන බව මෑතකදී තීරණය කරන ලද නඩු තීන්දු වල ප්‍රකාශ කර තිබේ. " සාකච්ඡා කරන්න.

(මුළු ලකුණු 20)

02. අ. කාර්මික ආරවුල් නිරාකරණය කිරීම සම්බන්ධව 1950 අංක 43 දරන කාර්මික ආරවුල් පනතේ දක්වා ඇති ක්‍රම මොනවාද ?

(ලකුණු 06)

ආ. කාර්මික අධිකරණයක සංයුතිය, බලතල හා යුතුකම් මොනවාදැයි සාකච්ඡා කරන්න.

(ලකුණු 08)

ඇ. කාර්මික අධිකරණයක් විසින් දෙනු ලබන තීරණයකින් ඇති වන බලපෑම කවරේද ?

(ලකුණු 06)

(මුළු ලකුණු 20)

03. අ. " වෘත්තීය සමිතියක් " යන්නෙහි අර්ථය පැහැදිලි කරන්න.

(ලකුණු 02)

ආ. වෘත්තීය සමිතියක මූලික අරමුණු මොනවාද ?

(ලකුණු 08)

ඇ. රාජ්‍ය සේවකයන්ගේ වෘත්තිය සමිති ලියාපදිංචි කිරීම සම්බන්ධයෙන් බලපාන විශේෂ සීමා කිරීම් මොනවාද ?

(ලකුණු 10)

(මුළු ලකුණු 20)

04 " 1954 අංක 19 දරන සාප්පු හා කාර්යාලීය සේවකයන් පිළිබඳව (සේවය සහ වේතන විධිමත් කිරීමේ) පනත, සේවකයාට ඔහුගේ සේවා ස්ථානයේදී අයිතිවාසිකම් ආරක්‍ෂා කරනු ලබන කාර්මික නීති ක්ෂේත්‍රයේ වූ තවත් වැදගත් පනතකි." සාකච්ඡා කරන්න.

(මුළු ලකුණු 20)

05. අ. සේවක අර්ථසාධක අරමුදල සහ සේවක භාරකාර අරමුදල අතර ඇති සමාන අසමානකම් පෙන්වා දෙන්න.

(ලකුණු 10)

ආ. 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම් පනත යටතේ සේවකයන්ට පාරිතෝෂික ගෙවීම් සම්බන්ධයෙන් සේවායෝජකගේ වගකීම් මොනවාද ?

(ලකුණු 10)

(මුළු ලකුණු 20)

06. අ. 1941 අංක 27 දරන පඩිපාලක සභා ආඥා පනත ඇති කිරීමේ අරමුණු මොනවාදැයි පැහැදිළි කරන්න.

(ලකුණු 04)

ආ. වැටුප් ගෙවීම සහ වාර්තා පවත්වාගෙන යාම සම්බන්ධයෙන් පඩිපාලක සභා ආඥා පනතේ අඩංගු විධිවිධානයන් පැහැදිලි කරන්න.

(ලකුණු 08)

ඇ. පඩිපාලක සභාවක සංස්ථාපනය සහ එහි බලතල මොනවාදැයි සාකච්ඡා කරන්න.

(ලකුණු 08)

(මුළු ලකුණු 20)

07. පහත සඳහන් මාතෘකා අතුරින් දෙකක් පිළිබඳව කෙටි සටහන් ලියන්න.

අ. සාමුහික ගිවිසුම්.

ආ. සේවා නියුක්තිකයන්ගේ සේවය අවසන් කිරීමේ පනත

ඇ. කම්කරු වන්දි ආඥා පනත

ඉ. ප්‍රසූතිකාධාර ආඥා පනත.

(ලකුණු 10x2= මුළු ලකුණු 20)